**දුරකථන/தொலைபேசி இல./Telephone Nos.**

| | |
|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | 2784832<br>2784807<br>2785617 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 2784812 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.


පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/10/11/03

දිනය / திகதி / Date } 2009.07.28

චක්‍රලේඛ අංක – **2009/26**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම රජයේ හා අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## පාසල තුළ ජංගම දුරකථන භාවිතය

පාසල් පද්ධතිය තුළ ජංගම දුරකථන භාවිතය වර්තමානයේ ඉතා බරපතල ගැටලුවක් බවට පත්ව ඇත. විශේෂයෙන් පාසල් කාලය තුළ දී කැමරා හා වීඩියෝ පහසුකම් සහිත ජංගම දුරකථන භාවිතා කරමින් අනවශ්‍ය ලෙස පාසල් ළමුන්ගේ ඡායාරූප ගැනීම, අසභ්‍ය දර්ශන ගබඩා කර තබා ගැනීම, පණිවිඩ හා දර්ශන යැවීම හා විනෝදාංශයක් වශයෙන් ඒවා නැරඹීමට පෙළඹී තිබීම හේතුවෙන් පාසල් තුළ විනය සම්බන්ධ ගැටළු උද්ගතවී ඇත.

02. නූතන සන්නිවේදන ක්ෂේත්‍රය තුළ දියුණුවී ඇති නවීන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ඉතා සරලව හා පහසුවෙන් විවිධ කාර්යය ඉටු කර ගැනීමේ හැකියාව ලැබී ඇත. තවද විවිධ දුරකථන සේවා සපයන්නන් විසින් විවිධ පහසුකම් තම ග්‍රාහකයන් වෙත සපයනු ලැබේ. මෙවන් තත්ත්වයක් තුළ ජංගම දුරකථන භාවිතා කරනු ලබන මූලික අරමුණට වඩා වෙනස් වූ කාර්යයන්ට භාවිතා කිරීමට පාසල් සිසුන් පෙළඹී ඇත. ඉතා සූක්ෂම ලෙස මෙම ජංගම දුරකථන පහසුකම් බහුලව සැපයෙන හෙයින් හා ක්ෂණිකව මකා දැමීමට හැකිවීම නිසා ද ඒවායින් සිදුවන අකටයුතුකම් පිළිබඳ ගුරුවරුන්ට ද, දෙමාපියන්ට ද දැන ගැනීමට ලැබෙන අවස්ථා සීමාවී ඇත.

03. මෙම තත්ත්වය තුළ ඉතා රහසිගත ලෙස පාසල තුළ ජංගම දුරකථන භාවිතයට සිසුන් නැඹුරුවී ඇති අතර එමගින් පාසල් විනයට බරපතල බලපෑමක් ඇති වී ඇති හෙයින් පාසල් සිසුන්ට කිසිම අවස්ථාවක කුමන අවශ්‍යතාවයක් වෙනුවෙන් වුවද ජංගම දුරකථන පාසල තුළට ගෙන ඒම හෝ භාවිතා කිරීම මින් ඉදිරියට සපුරා තහනම් ය. එසේම පාසල් කාර්ය මණ්ඩලය ද (විශේෂයෙන් ගුරුභවතුන්) පාසල් කාලය තුළ තම රාජකාරී කටයුතුවල නිරතවීමේ දී තම ජංගම දුරකථන ක්‍රියා විරහිත කර තැබිය යුතු ය.

D:\Sri\Mobile.doc

04. මීට අමතරව පාසල තුළට අසභ්‍ය දර්ශන ඇතුළත් විය හැකි සියලු ආකාරයේ මුද්‍රිත ලේඛන හා විද්‍යුත් උපකරණ රැගෙන ඒම, නැරඹීම හා කියවීම සපුරා තහනම් ය. තවද ජායාරූප හා/හෝ වීඩියෝ කැමරා පාසල් අවශ්‍යතාවයක් සඳහා ගෙන ඒමට පාසල් බලධාරීන්ගේ අවසර රැගෙන ඇති අවස්ථාවක් හැරුණු කොට අනෙක් කිසිම අවස්ථාවක රැගෙන ඒම තහනම්ය. මෙම උපදෙස් නොසළකා විනය රැක ගැනීමට බාධාවක් වන අයුරින් පාසලට ගෙන එනු ලබන උපකරණ පාසල භාරයට ගෙන සුදුසු පියවර ගැනීමේ බලය පාසල් කළමණාකාරිත්වයට ඇත.

05. එමෙන්ම එවැනි දෑ ගෙන එන සිසුන් සම්බන්ධයෙන් ද පාසල තුළ විනය ආරක්ෂා කිරීම හා දඬුවම් පැනවීමට අදාළව නිකුත් කර ඇති අංක 2005/17 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනි නොවන ආකාරයෙන් ක්‍රියා කළ යුතු ය.

06. මේ සම්බන්ධයෙන් පාසල ගන්නා තීරණ හා ක්‍රියාමාර්ග පිළිබඳව පාසල විසින් සියලුම සිසුන්, දෙමාපියන් හා පාසල් කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමට වග බලා ගත යුතු ය.

07. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන රජයේ පාසල් හා අනුමත පෞද්ගලික පාසල් තරයේ පිළිපැදිය යුතු අතර, අනෙකුත් සියලුම පාසල් ද අනුගමනය කිරීම යෝග්‍ය යැයි අපේක්ෂා කෙරේ.

එස්.යූ. විජේරත්න
වැඩ බලන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය